# (ඌ) සේවා නියුක්තිය හා කම්කරු සම්බන්ධතා.

## සේවා නියුක්තිය.

සේවා නියුක්තිය ගැන නියැදි සමීක්ෂණයන් පවත්වා ඇති වර්ෂයන් සම්බන්ධයෙන් හැරුනාම අනෙක් වර්ෂයන් සම්බන්ධයෙන් සේවා නියුක්තිය සහ සේවා වියුක්තිය පිළිබඳ, වාර්ෂික සංඛ්‍යා තොරතුරු නොමැතිය. දැනට ඇත්තා වූ තරමක්වත් අදාල එකම සංඛ්‍යා තොරතුරු වනුයේ රක්ෂා සඳහා හා වඩා හොඳ රක්ෂා සඳහා රැකී රක්ෂා කාර්යාල වල ලියා පදිංචි වූවන්ගේ සංඛ්‍යා තොරතුරුය. මෙම සංඛ්‍යා තොරතුරු වලින් සේවා වියුක්තියේ ප්‍රමාණය මිනිය නොහැකි වුවද, එම සංඛ්‍යා තොරතුරු කාලයක් තුළ සේවා වියුක්තියේ සිදු වූ වෙනස්කම් පිරික්සීම සඳහා ප්‍රයෝජනයට ගත හැකිය.

1965 දී සියයට 20·7 කින්ද, 1966 දී සියයට 19·7 කින්ද, සිදුවූ වැඩිවීම හා සසඳ බලන විට, 1967 තුළදී ලියා පදිංචි වූවන්ගේ වැඩිවීම, ඒ ඒ වර්ගය යටතේ මෙසේ සඳහන් කළ හැකිය. කාර්මික සහ ලිපිකරු සියයට 9·8, පුහුණු සියයට 8·9, අර්ධ-පුහුණු සියයට 10·8, නුපුහුණු සියයට 3·5, 1966 අනුරූප තුල්‍ය සංඛ්‍යා පිළිවෙලින් සියයට 19·7, 8·4, 22·9, සහ 20·7 ක් විය.

මෑත වර්ෂ වලදී රැකී රක්ෂා කාර්යාල මගින් රැකියා ලබා දෙනු ලැබූ අයගේ සංඛ්‍යා තොරතුරු II (ඌ) 1 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වේ.

### II (ඌ) 1 වැනි සංඛ්‍යා සටහන

**රැකියා ලබාදෙනු ලැබූ පුද්ගලයින්ගේ සංඛ්‍යාව සහ එක් එක් වර්ගය යටතේ, ලියාපදිංචි වී ඇති මුළු සංඛ්‍යාවට එහි ඇති සාපේක්ෂ වැදගත් කම.**

| වර්ෂය | කාර්මික හා ලිපිකරු | % | පුහුණු | % | අර්ධ පුහුණු | % | නුපුහුණු | % | මුළු ගණන | ලියාපදිංචිවූවන්ගේ මුළු ගණනේ % ගණනක් වශයෙන් |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1957 | 1,176 | 6·3 | 709 | 5·3 | 1,180 | 3·8 | 3,053 | 6·4 | 6,118 | 5·5 |
| 1958 | 1,827 | 9·2 | 800 | 5·9 | 1,006 | 3·1 | 2,251 | 4·4 | 5,884 | 5·0 |
| 1959 | 1,667 | 8·0 | 1,045 | 7·5 | 1,275 | 3·8 | 3,218 | 5·4 | 7,205 | 5·6 |
| 1960 | 1,400 | 5·3 | 771 | 4·6 | 1,247 | 3·6 | 4,744 | 6·5 | 8,162 | 5,4 |
| 1961 | 1,259 | 4·6 | 631 | 3·5 | 964 | 2·8 | 2,794 | 3·9 | 5,648 | 3,7 |
| 1962 | 1,263 | 3·7 | 468 | 2·7 | 809 | 2·3 | 2,315 | 3·5 | 4,857 | 3,2 |
| 1963 | 1,322 | 3·7 | 502 | 3·0 | 836 | 2·3 | 2,466 | 3·9 | 5,129 | 3,4 |
| 1964 | 1,722 | 4·4 | 535 | 3·1 | 945 | 2·5 | 3,599 | 5·5 | 6,801 | 4·3 |
| 1965 | 1,495 | 2·7 | 846 | 4·2 | 1,035 | 2·1 | 3,753 | 5·0 | 7,129 | 3·6 |
| 1966 | 1,056 | 1·6 | 740 | 3·4 | 917 | 1·5 | 4,089 | 4·5 | 6,802 | 2·9 |
| 1967* | 1,018 | 1·4 | 585 | 2·5 | 711 | 1·1 | 1,869 | 2·0 | 4,183 | 1·6 |

මූලය: කම්කරු දෙපාර්තමේන්තුව.

* තාවකාලිකයි.

## පොදු අංශයේ සේවා නියුක්තිය.

පොදු අංශයේ සේවා නියුක්තියෙහි වෙනස්වීම් පිළිබඳව මහ බැංකුව මගින් කෙරෙන වාර්ෂික විමර්ශනය, 1967 දී ද පවත්වන ලදී. රාජ්‍ය සහ අර්ධ-රාජ්‍ය ආයතන සියල්ලකින් ම විමසීමෙන් පසු. රජයේ දෙපාර්තමේන්තු වලින් සියයට

73 කින් ද, අර්ධ-රාජ්‍ය ආයතන වලින් සියයට 83 කින් ද, සංඛ්‍යා තොරතුරු ලබා ගැනීමට බැංකුවට හැකි වුනි. පසුව සඳහන් කළ කොටසට රජයේ සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල සහ මහ බැංකුව ද ඇතුළත් වෙයි.

බැංකුවේ විමසීමට පිළිතුරු එවූ රජයේ දෙපාර්තමේන්තු 57 හි, 1967 අවසානයේ දී සිටි මුළු සේවක සංඛ්‍යාව 1,11,456 ක්වූ අතර, 1966 අවසානයේ දී එම දෙපාර්තමේන්තුවල සිටි සේවකයන්ගේ සංඛ්‍යාව 1,08,025 ක් විය. මෙම සේවකයන් අතුරෙන් සියයට 83 ක් ස්ථිර සේවකයන් වූ අතර, සියයට 8 ක් තාවකාලික ද, සියයට 9 ක් අනියම් ද විය. 1966 වර්ෂය අවසානයට අදාළ අනුරූප සංඛ්‍යා පිළිවෙලින්, සියයට 85, 8 සහ 7 විය. වර්ෂය අවසානයේ හා ආරම්භයේ දී රැකියාවල නියුතු වූවන්ගේ සංඛ්‍යාවල වෙනස, සේවා නියුක්තියේ සිදු වූ වෙනස්වීම් වල මිණුමක් සේ උපයෝගි කොට ගෙන, පසුගිය වර්ෂයට වඩා 1967 දී රජයේ දෙපාර්තමේන්තුවල ස්ථිර සහ තාවකාලික රැකියා සියයට 1·3 කින් වැඩිවී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. අනියම් සේවකයන් වශයෙන් බඳවාගත් සේවකයන්ගේ සංඛ්‍යා තොරතුරු අධික උච්චාවචන ස්වභාවයකින් යුක්ත නිසා, අනියම් සේවකයන්ගේ සේවා නියුක්තියේ වෙනස්වීම් පිළිබඳව ඇස්තමේන්තු කිරීමක් මෙහි දක්වා නොමැත.

බැංකුවට සංඛ්‍යා තොරතුරු ලබාගැනීමට හැකි වූ අර්ධ රාජ්‍ය ආයතන 39 යෙහි, 1967 අවසානයේ දී සේවකයන් 1,05,150 ක් සිටි අතර, 1966 අවසානයේදී සිටි සේවකයන්ගේ සංඛ්‍යාව 1,04,223 ක් විය. මෙම සේවකයන් අතුරෙන් සියයට 73 ක් ස්ථිර, සේවකයන් වූ අතර, සියයට 9 ක් තාවකාලික ද, සියයට 18 ක් අනියම් ද විය. 1966 වර්ෂය අවසානයට අදාළ අනුරූප සංඛ්‍යා පිළිවෙළින් සියයට 69, 12 සහ 19 විය. විමසීමට ලැබුණු පිළිතුරු වලට අනුව අර්ධ රාජ්‍ය ආයතනවල ස්ථිර සහ තාවකාලික රැකියා, සියයට 2 කින් වැඩිවී ඇත.

## කම්කරු සම්බන්ධතා

වර්ෂය තුළ වූ වැඩ වර්ජන සහ නැතිවූ මිනිස් දින ගණන පිළිබඳ, මෙම වාර්තාව පිළියෙළ කරන අවස්ථාවේ පැවැති සංඛ්‍යා තොරතුරු තාවකාලික ඒවා විය. වැඩ වර්ජන අධිකව පවත්නා, වර්ෂයේ අවසාන මාස දෙකේ සංඛ්‍යා තොරතුරු, අසම්පූර්ණවීම ප්‍රධාන වශයෙන් හේතු කොටගෙන, ඉකුත් වර්ෂ වල දී මෙම සංඛ්‍යා තොරතුරු ඇස්තමේන්තු වී ඇත්තේ, පමණට වඩා අඩුවෙනි.

1966 වර්ෂය සසඳ බලන විට, 1967 දී වැවිලි අංශයේ, නැති වූ මිනිස් දින ගණන කැපී පෙනෙන ලෙස පහත බැස ඇත. කෙසේ වෙතත්, 1966 දී වැවිලි අංශයේ ඉතාමත් අධික මිනිස් දින ගණනක් නැති වූ බව සිහිපත් කළ යුතුය. 1966 හැර, ඉකුත් දශ වර්ෂය සඳහා වූ සාමාන්‍යය සමග සසඳන කල 1967 සංඛ්‍යාව, සියයට 3 ක වැඩිවීමක් දක්වයි. 1967 දී වැවිලි නොවන අංශයෙහි නැති වූ මිනිස් දින ගණන 1966 සංඛ්‍යාවට වඩා සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. වැවිලි අංශයෙහි මෙන් මෙය සංසන්දනය ද යථාර්ථ නිරූපනයක් නොකරයි. ඉකුත් දශ වර්ෂයෙහි සාමාන්‍යය සමග සසඳන විට, 1967 සංඛ්‍යාව ඇත්ත වශයෙන් ම සියයට 8 කින් පහළ බැස ඇත.

පැවැති වැඩ වර්ජන වලින් සියයට 37 කට පමණ හේතු වී ඇත්තේ රැකියා අහිමි වීම වූ අතර, සියයට 21 කට වතු අණපනත් සහ වැඩ සකසන අඳදමද තවත් සියයට 11 කට සාමාන්‍ය ඉල්ලීම් ද හේතුවිය.

වැඩ වර්ජන සංඛ්‍යාව, ඊට සම්බන්ධ වූ සේවකයන්ගේ සංඛ්‍යාව සහ වැඩ වර්ජන නිසා නැති වූ මිනිස් දින ගණන II (උ) 2 වැනි සටහනෙහි දක්වා ඇත.

## සංඛ්‍යා සටහන II (උ) 2
## වැඩ වර්ජන

| වර්ෂය | වතු | | | අනෙක් රැකියාවල් | | |
|---|---|---|---|---|---|---|
| | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවකයන් ගණන | නැති වූ මිනිස් දින ගණන | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවකයන් ගණන | නැති වූ මිනිස් දින ගණන |
| 1956 | 99 | 56,908 | 2,00,888 | 115 | 31,852 | 1,52,966 |
| 1957 | 177 | 2,97,061 | 6,18,050 | 127 | 70,239 | 1,90,443 |
| 1958 | 123 | 39,372 | 3,40,632 | 96 | 42,713 | 3,99,228 |
| 1959 | 177 | 47,318 | 3,52,095 | 71 | 42,453 | 4,60,141 |
| 1960 | 123 | 42,528 | 2,59,948 | 37 | 4·839 | 15,139 |
| 1961 | 90 | 29,223 | 3,17,866 | 39 | 38,013 | 1,70,372 |
| 1962 | 138 | 42,569 | 1,93,792 | 50 | 25,730 | 8,01,882 |
| 1963 | 174 | 62,511 | 3,59,905 | 58 | 29,819 | 4,79,678 |
| 1964 | 201 | 68,009 | 6,11,060 | 103 | 21,400 | 2,74,623 |
| 1965 | 175 | 70,929 | 4,82,259 | 55 | 10,085 | 89,952 |
| 1966 | 132 | 1,38,259 | 41,17,264 | 32 | 4,592 | 34,351 |
| 1967† | 175 | 66,719 | 3,76,730 | 32 | 13,167 | 2,77,739 |

මූලය: කම්කරු දෙපාර්තමේන්තුව.

† තාවකාලිකයි.